www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ජී-7 කන්ඩායමේ රැස්වීම ඉස්මතු කරන්නේ එක්සත් ජනපදයේ හා ලෝක ආර්ථිකයේ ගැඹුරුවන ගැටලු ය

## G7 meetings highlight deepening problems for US and world economy

**නික් බීම්ස් විසිනි**

**2007 ඔක්තෝබර් 23**

19 වැනි සිකුරාදා ඒකක 360කින් නැතහොත් සියයට 2.6කින් පහත වැටුනු ඩව්ජෝන්ස් දර්ශකය වෝල්වීදිය මතට කඩාවැදීම, වැඩි අවදානමක් සහිත නිවාස හා නය අර්බුදය පහව යමින් තිබෙනවාට වඩා ආරම්භ වූවා පමනක් බවට තියුනු අනතුරු ඇඟවීමක් විය. *වෝල්ස්ට්‍රීට් ජර්නලය* "මූසල" දිනයක් ලෙස හැඳින්වූ 22 දිනයේ වෙලඳපොලෙහි වාර්තා වූයේ ඒකක 45ක ඉහල යාමක් පමනි.

විකුනාදැමීමට තුඩු දුන් එක් හේතුවක් වූයේ එක්සත් ජනපද ආර්ථිකය අවපාතයක් කරා පවා ලුහුටා යාහැකි වර්ධනයේ පහත වැටීමක් පිලිබඳ වැඩෙමින් ඇති සලකුනුය. යෝධ යන්ත්‍රෝපකරන නිෂ්පාදන සමාගමක් වන කැටපිලර් දැනට මත් එය සලකුනු කර අවසන් ය. මේ තාක් දුරට එය කනස්සල්ල පලකලේ එක්සත් ජනපද ආර්ථිකය දැනටමත් අවපාතයක ගිලෙමින් තිබෙන බව හෝ ඊට සමීපව ඇති බවට ය.

එක්සත් ජනපද ආර්ථිකය පහත වැටීමකට ඇදීයමින් තිබෙන බවට වන කනස්සල්ල සියලු ප්‍රධාන ආර්ථික වාර්තාවලින් වැඩිදියුනු කලේය. තෙල් මිල මෑත දිනවල දී බැරලයකට ඩොලර් 90ක් සීමාව ඉක්මවූයේ 100 වැඩි ඈතක නොවන බවට පලවන අනාවැකි ද සමගිනි.

ඒ සමග ම ඇමරිකානු ආර්ථිකයට, දිගහැරෙමින් ඇති නිවාස අර්බුදයෙන් පහර වැදෙමින් ඇති අතර වැඩිවැඩියෙන් මිනිසුන් උකස් නය පැහැරහැරීම, වෙන්දේසියේ දැමීම් හා මිල පහත වැටීමට තුඩුදෙමින් එලඹෙන මාසවල දී වඩාත් නරක අතට හැරෙනු ඇත. 2009 වසරට පෙර එක්සත් ජනපද නිවාස වෙලඳපොල යලි ගොඩ නොඑනු ඇතැයි අනතුරු ඇඟවූ වෝල් වීදියේ නිපුන විශ්ලේෂකයෙකු වන ඊව් සෙල්මාන්ගේ තක්සේරුව උපුටා දක්වමින් බ්ලූම්බර්ග් හි වාර්තාවක් පලවිය.

අවපාතයක් පිලිබඳ ඉඩකඩ සියයට 50 සිට 60 දක්වා වන බව සඳහන් කල ඇය "මෙතරම් නරක වෙලඳපොලක් කිසි දිනෙක දැක නැති බව" කීවා ය.

නිවාස මිල ගනන් පෞද්ගලික ආදායමට වඩා බෙහෙවින් ඉහල යාමේ ප්‍රවනතාවය නිසා අර්බුදය ගැන සැහෙන කලක් තිස්සේ අනතුරු ඇඟවීම් කර ඇති සෙල්මාන්, කියා සිටියේ, නිවාස මිල සියයට 16 හා 22 අතර ගනනකින් පහත වැටීමත් සමග තත්වය තව දුරටත් නරක අතට හැරීමේ ඉඩක් පවතින බව ය.

අගෝස්තුවේ දී මූල්‍ය අර්බුදය පැන නැගීමෙන් පසු ප්‍රථම වතාවට, සති අන්තයේ වොෂින්ටන්හි දී මුදල් ඇමතිවරු 7 දෙනාගේ කන්ඩායමේ (ජී-7) හා මධ්‍යම බැංකුකරුවන්ගේ රැස්වීම පැවැත්වූයේ, මෙම සන්දර්භය තුල ය. වැඩෙන ගෝලීය ආර්ථික හා මූල්‍ය ගැටලුවලට කිසිදු විසඳුමක් ඉන් ඉදිරිපත් නොවූ අතර, පෙන්නුම් කලේ මහා බලවතුන් අතර ගැඹුරුවන මතභේද ය.

ප්‍රන්සයට හා ජර්මනියට අවශ්‍යවූයේ එක්සත් ජනපද ඩොලරය පහත වැටීම නිසා යුරෝපය මුහුන පාන ගැටලු සැලකිල්ලට ගන්නා අවසන් ලියවිල්ලකි. එහෙත් එක්සත් ජනපද භාන්ඩාගාර ලේකම් හෙන්රි පෝල්සන් එම යෝජනාව බැහැර කරමින්, චීනය සිය රෙන්මින්බි මුදල ඩොලරයට සාපේක්ෂව ඉහල යැමට ඉඩහල යුතු බවට අනතුරු අඟවමින් රැස්වීම එහි සිර කලේය.

ඔක්තෝබර් 23 දින ලන්ඩන්හි පලවන *ෆිනෑන්ෂල් ටයිම්ස්* පුවත්පතේ කතුවැකියක් තුල මෙම බෙලහීනතාවය දැඩි දෝෂ දර්ශනයට ලක් කලේ ය.

"ක්‍රියාවට නැගිය නොහැකි දැඩි අදහස් වඩා ප්‍රවේශම් සහගත ය. වොෂින්ටනයේ ඔවුන්ගේ රැස්වීම තුල 7 කන්ඩායමේ මුදල් ඇමතිවරු හා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විධායකයේ, සීරුමාරු කිරීමට තමන්ට බලයක් ඇති ඩොලරයේ ආරක්ෂාව සඳහා කිසිවක් නොකල අතර, එවැන්නක් සඳහා ඔවුන්ට කිසිදු බලයක් නොමැති චීන රෙන්මින්බි මුදලේ වේගවත් ඉහල යැමක් ඉල්ලා සිටියහ. එය පෙන්නුම් කරන්නේ ජාත්‍යන්තර මූල්‍ය පද්ධතියේ සිරවීමයි."

දැනට නිතිපතා ඩොලර් 1.43කට හෝ ඊට වැඩියෙන් අලෙවි කෙරෙන යුරෝ මුදලට සාපේක්ෂව ඩොලරයේ වැටීම, යුරෝපීය අපනයන වෙළඳපොලට තර්ජනය කරන අතර එය තව දුරටත් පහල ගියහොත් බලපෑම තවත් දැඩි විය හැකි ය. ඩොලරයේ වැටීම ලෝක වෙළඳපොලේ ඇමරිකානු අපනයනයන්ට වැඩි වාසි සලසන බැවින් එක්සත් ජනපද නිලධාරින් මේ ගැන කිසිවක් කිරීමෙන් වැලකී සිටිති.

කෙසේ වෙතත්, එක්සත් ජනපද මූල්‍ය වත්කම් මිලට ගෙන ඇති විදේශ ආයෝජකයන්, තම ඩොලර් වත්කම්වලට අලාභ විඳිය නොහැකි බැවින් ඒවා ඉවත් කර ගැනීමට තීරනය කලහොත් මෙම ප්‍රතිපත්තියෙන් දැඩි ප්‍රතිවිපාක ඇති විය හැකිය. එක්සත් ජනපද මූල්‍ය ක්‍රමය දිනකට ඩොලර් බිලියන 2කට ආසන්න වන අවශේෂ ලෝකයෙන් ගන්නා මුදල් මත රඳා පවතින තත්වය තුල එවන් ක්‍රියාවලියක් පන ගන්වනු ඇත්තේ "බියකරු සිහින වාතාවරනය" යන නම පටබැඳ ඇති තත්වයකි. එනම් ඩොලරයේ කාලය ඉක්මවීමක් පොලී අනුපාතිකය ඉහල නංවනු ඇති අතර එමගින් එක්සත් ජනපද ආර්ථිකය මූලික අවපාතයක් කරා ගෙන එනු ලැබීම යි.

21 දින පැවැත්වූ කථාවක දී හිටපු මහ බැංකු සභාපති ඇලන් ග්‍රීන්ස්පෑන් ප්‍රකාශ කලේ ඩොලරයේ පිරිහීම, විදේශිකයන්ගේ පැත්තෙන් එක්සත් ජනපද සුරැකුම් මිලට ගැනීමට ඇති වැඩෙන අකමැත්ත ප්‍රකාශිත වීමක් විය හැකි බවයි.

"විදේශිකයන් කරා මෙම ගැටලු ලඟාවීමේ දුරෙහි සීමාවක් පවතියි." 1997ට පසුව ඩොලරය ඇද වැටුනු පහලම මට්ටම මේ බව පෙන්වා දෙමින් ඔහු කියා සිටියේ මෙය "එම සීමාව කරා ඇමරිකාව ලඟාවෙමින් සිටින බවට ඇඟවීමක්" විය හැකි බවයි.

ග්‍රීන්ස්පෑන්ගේ අනතුරු ඇඟවීම පැමිනියේ, අගෝස්තුවේ දී ජාත්‍යන්තර ආයෝජකයන් වාර්තාගත ප්‍රමානයක එක්සත් ජනපද මූල්‍ය වත්කම් විකුනා ඇති බවට පලවූ එක්සත් ජනපද භාන්ඩාගාරයේ වාර්තාවකට පසුව ය. එක්සත් ජනපදයේ විදේශීය ව්‍යාපාරවස්තු සංචිත, එනම් බැඳුම්කරයන් හා නෝට්ටු, ජූලි මාසයේ දී බිලියන 19.2ක වැඩි වීමකින් පසු අගෝස්තුවේ දී බිලියන 69.3කින් පහල වැටුනි. ජාමූඅ හිටපු විධායක අධ්‍යක්ෂ රොඩ්රිගෝ රාමෝ විසින් මෙම අන්තරායන් ගැන තව දුරටත් සඳහන් කලේ ය. "ඩොලරයේ ම හදිසි වැටීමක් හෝ වෙනත් දේ නිසා ඩොලරයේ හදිසි වැටීමක් මගින් ඩොලර් වත්කම්වල විශ්වාසය බිඳ වැටීමේ අන්තරායන් පවතියි."

පසුගිය දශක ගනනාව තුල ගොඩනැගෙමින් තිබුනු ආර්ථික ගැටලු මාලාවක් දැන් මතුපිටට පැමිනෙමින් තිබෙන බවට වැඩෙන අවබෝධය, ජී-7 රැස්වීම්වල ආධිපත්‍යය දැරී ය. කෙසේ වෙතත් මෙම අවබෝධය බැඳී තිබුනේ, ඒකාබද්ධ ප්‍රතිචාරයක් දැක්විය යුතු අවස්ථාවේ ම, අභ්‍යන්තර බෙදීම නිසා අත්‍යාවශ්‍ය ප්‍රතිපත්ති සැකසීමට ජාමූඅ පවතින නොහැකියාව පිලිබඳ වැඩෙන නොසන්සුන්තාවය මගින් ය.

වර්තමාන නය මිරිකීම "පසුගිය දශකය පුරා පැන නැගී ඇති යෝධ වෙලඳ අසමතුලිතයන් ගේ ප්‍රතිඵල වශයෙන් හටගත් බොහෝ අවුල් සහගත සිදුවීම්වල ප්‍රථම එක විය හැකි ය. ඔවුන් ලෝකය පුරාම පොලී අනුපාතිකයන් කෘතීම ලෙස පහත දමා නොසැලකිලිමත් නය දීම් දිරි ගන්වා තිබේ." යන්න මධ්‍යම බැංකුකරුවන්ගේ පෞද්ගලික මතය වන බව *ෆිනෑන්ෂල් ටයිම්ස්* වාර්තාවක් සටහන් කරයි.

පුවත්පතට අනුව, හිටපු කැනේඩියානු මධ්‍යම බැංකු ප්‍රධානී ඩේවිඩ් ඩොජ්, අනෙකුත් අය තිරයට පිටුපස සිට කියන දේ ප්‍රසිද්ධියේ පලකලේ ය.

"ගෝලීය අසමතුලිතයන් සමග පොර බැදීමේ දී අරමුදලේ හැකියාවන් හා දක්ෂතාවන් අපට හරියට ම අවශ්‍යවන වේලාව මෙයයි." එහෙත් ජාමූඅ අභ්‍යන්තර බැදීම්වල අර්ථය වර්තමාන ප්‍රතිපත්තිය පිලිබඳ පොදු මතයකට පැමිනීමේ ඉඩකඩ අඩු වී තිබෙන බවය. "අසමතුලිතයන් පවතින කාලය දිගුවන්නේ නම්, ගැටලුව නිරාකරනය කර ගැනීමේ අවුලකින් අප කෙලවර වීමේ බලගතු අන්තරායක් පවතින්නේය"යි ඔහු අනතුරු ඇඟවී ය.

© www.wsws.org